**<u>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු ලෙස පවතින තනතුරු සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන් අනුයුක්ත කරවා ගැනීම</u>**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ **පහත සඳහන්** තනතුරු පුරප්පාඩුව පවතී.

| තනතුරු නාමය | සේවය | ශ්‍රේණිය | වැටුප් කේතය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 1 පන්තියේ III/II ශ්‍රේණිය | SL -1 | 01 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | | 2 පන්තියේ II/I ශ්‍රේණිය | MN - 6 | 01 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | | 3 පන්තියේ III/II/I ශ්‍රේණිය | MT 1 | 07 |

සටහන :- පද්ධති සංවර්ධනය හා/හෝ ජාල කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් පළපුරුද්දක් සහිත නිලධාරීන් සඳහා ප්‍රමුඛත්වයක් හිමි වේ.

02. ඉහත තනතුරු සඳහා ස්ථාන මාරු ලබා ගැනීමට කැමති ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන් සිටීනම් එම නිලධාරීන්ගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, පත්වීම් ලිපියේ අංකය සහ සක්‍රිය දුරකථන අංකය ඇතුළත් ජීව දත්ත පත්‍රිකාවක්, අදාළ අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම්වල සහතික කළ පිටපත් සහ දැනට සේවයේ නියුතු ආයතන ප්‍රධානියාගේ නිර්දේශයද සමඟ **2023.07.15** දිනට පෙර dgitm@itmd.treasury.gov.lk විද්‍යුත් ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් හෝ අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව, මහලේකම් කාර්යාලය, කොළඹ 01 ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

ජේ.එච්.එස්.පී. ජයමහ
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට